**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතිය (අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) – 2021**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ඒජනස් ෆැන්කයිස් ඩි.ඩිව්ලොප්මන්ට් අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹී අංක සී.එල්.කේ.1008-01පී දරණ ණය ගිවිසුමේ 3.4.2(එච්)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ, තිරසාර බව පෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් මූල්‍යනය කිරීමට ඒජන්ස් ෆැන්කයිස් ඩී.ඩිවෙලොප්මන්ට් එකඟවී තිබුණි. ඉතිරි රු.මිලියන 3,900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර තිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2023 ජූනි 30 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | | රු.මිලියන | | |
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව 2019 වසරේ විනිමය අනුපාත වෙනස රු.මිලියන 7.99 ට සමාන ඩොලර් 44,071.23 ක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශන වලට වෙත ගෙනවිත් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ ණය ශේෂය හා කෙරීගෙන යන වැඩ ගිණුම සමාන වටිනාකමකින් අඩු වී තිබුණි. | 7.99 | යෝජිත ගැලපීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල සිදු කෙරේ. | දෝෂය නිවැරදි කිරීමට පියවරගත යුතු අතර අනාගතයේදී එවැනි දෝෂ වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | උපදේශන කොන්ත්‍රාත්තුව යටතේ රු.මිලියන 6.45 පිරිවැයකට පරිඝණක හා කාර්යාලීය ගෘහ භාණ්ඩ මිලදීගෙන තිබූ අතර එම වත්කම් උපදේශන හා ව්‍යාපෘති කාර්යමණ්ඩලය විසින් භාවිතා කරනු ලබයි. කෙසේ වෙතත්, ඒවා ස්ථාවර වත්කම් ලෙස පෙන්වීම වෙනුවට උපදේශන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා (PIU) කොන්ත්‍රාත්කරුවන් විසින් සපයන ලද පරිඝණක හා කාර්යාලීය ගෘහභාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස පෙන්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. | 6.45 | යෝජිත ගැලපීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල සිදු කෙරේ. | දෝෂය නිවැරදි කිරීමට පියවරගත යුතු අතර අනාගතයේදී එවැනි දෝෂ වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.2. වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 4.2.2 වගන්තියට පටහැනිව ICB-03 කොන්ත්‍රාත්තුව යටතේ දෙමහල් කාර්යාලීය නිල නිවාස ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට ව්‍යාපෘතිය විසින් සති 45 ක් (දින 313 ක් ) ගත කර තිබුණි. | එය අඹතලේ ජල පවිත්‍රාගාරය පරිශ්‍රයට මාරුකිරීමත් සමඟ නිල නිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ විෂය පථය වෙනස් වී ඇත. කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ජා කරන ලද මෙම වෙනස්කිරීම් අනුව එම වෙනස්කම් ඇතුලත් කරමින් සංශෝධන 01 සකස් කරන ලදී. ඒ අනුව, එම හේතු නිසා ප්‍රදාන ලිපිය ප්‍රදානය කිරීමට ප්‍රමාද විය. | ඉදිරියේදී මෙවැනි ප්‍රසම්පාදන ප්‍රමාදයන් වළක්වා ගැනීමට ක්‍රියාකල යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 29 වන දින එහි කටයුතු ආරම්භ කර 2019 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කල කාලය තුල ඉලක්කයන් සපුරාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2023 ජුනි 30 දක්වා දෙවරක් දීර්ඝ කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ වී වසර 07 කුත් මාස 03 ක් ගත වී තිබියදීත් ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 56.83 ක් සහ සියයට 43.89 ක් විය. පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

| අංකය | ක්‍රියාකාරකම් | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණකගේ නිරීක්ෂණ | කළමනාකරණය අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත ඉලක්ක (%) | ළඟාකරගත් ඉලක්ක (%) | | | |
| (අ) | කි.මී. 5 ක් සඳහා මි.මී.1,200 මෘදුයකඩ නල සැපයීම සහ එළීම ඇතුළු 15000m3 ගොතටුව ජලාශය හා අධි පීඩන බලැති පොම්පාගාරයක් ඉදිකිරීම (අයිසීබී - 03) | 59.90 | 31.03 | කොන්ත්‍රාත් කාලය දීර්ඝවීමේ හැකියාව සහ එය ව්‍යාපෘතිය නිම කිරීමට අහිතකර ලෙස බලපෑ හැකිය | මුල් ගිවිසුම සුහදව අවසන් කිරීම, සෞඛ්‍ය අමාත්‍යාංශය ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සහ ඉන් පසුව අඹතලේ ජල පවිත්‍රාගාර පරිශ්‍රයට ගෙනඒම, ද්‍රව්‍ය ආනයනය සීමා කිරීම් සහ කොවිඩ් 19 වසංගතයේ බලපෑම වැනි විවිධ හේතු නිසා අයිසීබී - 03 කොන්ත්‍රාත්තුව ප්‍රමාද විය. | අනපේක්ෂිත තත්ත්වයන් කළමනාකරණය කර වැඩ කඩිනම් කිරීමට පියවර ගත යුතුය. තවද, කාල රාමුව තුල සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ නිතිපතා සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | අඹතලේ සිට එළිහවුස් ජලාශය දක්වා කි.මී. 9 ක මෘදු යකඩ ජලනල (මි.මී. 1200 විෂ්කම්භය) හා උපාංග සපයා එලීම් කිරීම (අයිසීබී - 04) | 100 | 82.98 | - එම - | අයිසීබී 04 කොන්ත්‍රාතතුව ප්‍රමාද වූයේ, ඉදිකිරීම් කාලය තුල දුෂ්කරතාවලට මුහුණදීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙනි. | - එම - |
| (ඇ) | අඹතලේ පහසුකම් වල විශ්වාසනීත්වය | 100 | 46.88 | සැලැසුම් කර ඇති පරිදි සම්ප්‍රේෂණ | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය, අනපේක්ෂිත භූමි | - එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වැඩිදියුණු කිරීම හා බලශක්තිය ඉතිරිකිරීම සඳහා සුදුසු ධාරිතාවයකින් යුතු කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම, සර්ෂණය අඩුකිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩි කිරීම තුලින් සම්ප්‍රේශණ අලාභ අවම කිරීම (අයිසීබී - 05) | | | අලාභ අවම කිරීම් හා බලශක්ති ඉතුරුම් කරගැනීමේ ප්‍රමාදය ව්‍යාපෘතිය නිම කිරීමට අහිතකර ලෙස බලපෑ හැකිය. | තත්ත්වයන් පැනනැගීමෙන් සැලැසුම් වෙනස්වීම, උප කොන්ත්‍රාත්කරුවන් පත්කිරීම ප්‍රමාද වීම නිසා අයිසීබී 05 කොන්ත්‍රාත්තුව ප්‍රමාද විය. | |
| (ඉ) | සැලැසුම් සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණය උපදේශන සේවාව (ඩී ආර් සී එස් සී) | 97.64 | 95.58 | උපදේශන කාල සීමාව 2020 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණයෙන් අවසන් කර තිබුණද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අකාර්යක්ෂමතාව සහ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ජාත්‍යන්තර හා දේශීය විශේෂඥයින් යොදවා නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් උපදේශන කාලය 2022 පෙබරවාරි 28 දක්වා දෙවරක් දීර්ඝ කර ඇත. | අයිතම 4.1.4 , 4. 1.2 සහ 4.1.3 හි දක්වා ඇති හේතු නිසා අනෙකුත් සියළුම කොන්ත්‍රාත් පැකේජ දීර්ඝ කිරීමත් සමඟ ඩීආර්සීඑස්සී කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට අවශ්‍ය විය. | නියමිත කාල රාමුව තුල සම්පූර්ණ කිරීම පිණිස ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට හා සමීපව අධීක්ෂණය කිරීමට උපදේශක විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංක | විගණකගේ නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ජාත්‍යන්තර හා දේශීය ප්‍රධාන විශේෂඥයින් නොයෙදවීම, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් සැලැසුම් සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාවේ කාල සීමාව 2022 පෙබරවාරි 28 දක්වා දෙවරක් දීර්ඝ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කය වූ සියයට 97.64 න් සියයට 95.58 ක් විය. | මින් පෙර ප්‍රධාන විශේෂඥයන් යෙදවීමකින් තොරව ඉතිරි කරගෙන උපදේශන සේවාව දීර්ඝ කර තිබේ. | කාලරාමුව තුල සම්පූර්ණ කිරීම සඳහා උපදේශක විසින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට සහ සමීපව අධීක්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව අයිසීබී 04 කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය ළඟාකරගෙන තිබුණේ සියට 82.98 ක් පමණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරු 2022 ජූනි 30 දක්වා වනවිටත් කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපොහොසත් වී ඇත. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය මන්දගාමීව පැවතීම සහ ඉහත සඳහන් පරිදි ඉදිකිරීම් සඳහා සැලකිය යුතු කාලයක් වැය කර ඇති අතර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 4 ට සමාන රු.මිලියන 83.46 ක් ප්‍රමාද ගෙවීම් සඳහා මූල්‍ය ගාස්තු ලෙසත් තාවකාලික අත්හිටුවීම් සඳහා අක්‍රීය ගාස්තු ලෙසත් ගෙවා ඇති අතරම 2021 පෙබරවාරි සිට 2022 මැයි මාසය අතර දීර්ඝ කිරීම් කාල සීමාව තුල ව්‍යාපෘතියේ මූලික වියදම් ලෙස රු.මිලියන 11.75 ක් දරා තිබුණි. | 4.1.2 යටතේ ප්‍රමාදයන් සඳහා ලබාදී ඇති හේතු නිසා කොන්ත්‍රාත්කරු ප්‍රමාද ගෙවීම් සඳහා මූල්‍ය ගාස්තු ඉල්ලුම් කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසිවල 14.8 වගන්තිය අනුව ප්‍රමාද ගෙවීම් සිදුකර ඇත. | අනපේක්ෂිත තත්ත්වයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර නියමිත කාල සීමාව තුල වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | කි.මී. 5 ක් සඳහා මි.මී. 1200 මෘදුයකඩ නල සැපයීම සහ එලීම ඇතුළුව 1500m3 ගොනටුව ජලාශය සහ බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව (ICB - 03) 2022 ජූනි 06 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. පසුව, එය 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර ඇත. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාව අනුව 2021 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 31.03 ක් වූ අතර එය 2022 මැයි 31 වන විට සියයට 53.55 ක් ලෙස පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිරි මාස 04 ක කොන්ත්‍රාත් කාලය තුල ඉතිරි සියයට 46.45 වැඩ නිම කිරීමට හැකිවේද යන්න විගණනයට සැක සහිත විය. | ව්‍යාපෘතිය නිර්ණය කිරීමේ මෙවලමට අනුව ඉදිරි මාස 04 තුල ප්‍රගතියේ ශේෂය සියයට 46.45 ළඟාකරගැනීමට ප්‍රායෝගිකව කළ නොහැක. කෙසේ වෙතත්, 2021 වර්ෂයේ සහ 2022 මැයි 31 වන දින දක්වා රටේ තත්ත්වය හේතුවෙන් ඉදිරිපත් කරන ලද වැඩසටහනට අනුව කොන්ත්‍රාත්කරුට සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගැනීම සඳහා ක්‍රියාකිරීමට හිතකර තත්ත්වයක් රට තුල නොතිබුණි. | නියමිත කාල සීමාව තුල වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කරමින් වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අඹතලේ පහසුකම්වල විශ්වාසනීත්වය වැඩිදියුනු කිරීම හා බලශක්තිය ඉතිරිකිරීම සඳහා සුදුසු ධාරිතාවයෙන් යුතු කාර්යක්ෂම පොම්ප සවිකිරීමේ කොන්ත්‍රාත්තුව (අයිසීබී - 05) 2020 දෙසැම්බර් අවසන් වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි. පසුව, කොන්ත්‍රාත් කාලය 2022 ජනවාරි 26 දක්වා දෙවරක් දීර්ඝ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සමස්ත ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලින් සියයට 45.60 ක බරතැබීමක් නියෝජනය කරන නමුත් සමස්ත භෞතික ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 වන විට සියයට 46.88 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. තවද, පිරියත සහ අමතර කොටස් සැපයීම යටතේ කාණ්ඩ 6 ක අයිතම 2022 ජූනි 30 දින වන විටත් මිලදී ගෙන නොතිබුණි. එබැවින් ව්‍යාපෘතිය දීර්ඝ කිරීමේ කාලය තුල කොන්ත්‍රාත්තුව නිම කිරීමට හැකිවේද යන්න සැක සහිතය. තවද, කොන්ත්‍රාත්කරු විසින් 2022 වසර අවසානය දක්වා කාල දිගුවක් ඉල්ලීම් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රදාන නියෝජිතායතනය විසින් 2022 ජූනි 30 දින වන විටත් අවසන් තීරණයක් ගෙන නොතිබුණි. | AFD වෙතින් පැහැදිලි කිරීම් ලැබෙන තෙක් සේවායෝජකයා විසින් කාලදිගුවක් ලබාදීමට බලා නොසිටින අතර කොන්ත්‍රාත්කරු විසින් සනාථ කිරීමට දෙන සාක්ෂි වල පිළිගතහැකිභාවය තීරණය කිරීමෙන් සේවායෝජකයා විසින් කාල දිගුවන් සඳහා අනුමැතිය ප්‍රදානය කරනු ලබයි. එසේ නොමැති නම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව ද්‍රවශීලතා අළාභ (LD) අදාල වේ. | - එම - |

**3.3 ඌණ උපයෝජිත වත්කම්**

| විගණකගේ නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, ණයදෙන නියෝජිතායතනය විසින් සිදුකරන ලද රු.මිලියන 9,100 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 70 ක මුළු ප්‍රතිපාදන වලින් සියයට 40.02 ක් නියෝජනය කරමින් රු.මිලියන 5,018.19 කට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 28.14 ක් පමණක් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ වී වසර 07 කුත් මාස 03 ක් ගතවීමෙන් පසු 2021 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එකතුව වූ ඩොලර් මිලියන 2.19 ට සමාන රු.මි. 358.71 ක් 2021 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය නොකල ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රජය විසින් ගෙවා තිබුණි. | සැලැසුම්කල පුරෝකථනයට අනුව කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ලබාදීමට ව්‍යාපෘතියට නොහැකි විය. එබැවින් ණය ගිවිසුමේ කොන්දේසිවලට අනුව බැඳීම් ගාස්තු ගෙවීමට රජයට සිදුවිය. | සංශෝධිත ව්‍යාපෘති කාල සීමාව තුල සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

**3.4 පද්ධති හා පාලන**

| අංක | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මූල්‍ය රෙගුලාසි (FR) 756 ප්‍රකාරව ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේදී ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය සිදු කෙරේ. | ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකල යුතුය. |
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති චක්‍රලේඛ අංක 05 මඟින් නියම කර ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් කර නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය ව්‍යාපෘතියේ ගනුදෙනු සම්බන්ධයෙන් 2021 වර්ෂය සඳහා විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |